# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2245/9 – 2021 සැප්තැම්බර් 14 වැනි අඟහරුවාදා – 2021.09.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැද පත්තුව සුළු කොට්ඨාසයේ 234, බැණ්ඩියමුල්ල උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බැණ්ඩියමුල්ල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක ජීඒ/ජීඒඑම්/2019/176 හා 2019.05.31 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – අළුබෝගහවත්ත – ප්‍රමාණය: **හෙක්. 0.3280**

උතුරට: හිමිකම් කියන්නා සහ වරිපනම් අංක සොයාගත නොහැකි ඉඩම්, මාර්ගය සහ රත්නාවලී බාලිකා විද්‍යාල පරිශ්‍රය; නැගෙනහිරට: රත්නාවලී බාලිකා විද්‍යාල පරිශ්‍රය සහ සියනෑ පාරේ වරි. අංක 32/20 සහ 32/19 දරන ඉඩම්; දකුණට: සියනෑ පාරේ වරි. අංක 32/19 දරන ඉඩම, ගජබා මාවතේ වරි. අංක 45, 1/43 සහ 39 දරන ඉඩම; බටහිරට: ගජබා මාවතේ වරි. අංක 39, 29 දරන ඉඩම් සහ හිමිකම් කියන්නා සහ වරි. අංක සොයාගත නොහැකි ඉඩම.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/17/2018/E/404.
2021 මාර්තු මස 02 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

10- 167